# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2301/33 - 2022 ඔක්තෝබර් මස 12 වැනි බදාදා - 2022.10.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 3/2002

**2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යොන්‍ය සහයෝගීතාව දක්වීමේ පනත**

2 වන වගන්තිය යටතේ වූ නියමය

2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යොන්‍ය සහයෝගීතාව දක්වීමේ පනතේ 2 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ වන මම, එකී පනතේ විධිවිධාන, සාපරාධී කාරණාවල දී අන්‍යොන්‍ය නෛතික සහයෝගය ලබාදීම පිළිබඳ බිම්ස්ටෙක් (බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල බහු ආංශික තාක්ෂණික ආර්ථික සහයෝගීතාව සඳහා වන එකමුතුව) සම්මුතියේ පාර්ශ්වකරුවන් වන රටවල් සම්බන්ධයෙන් අදාළ වන බවට මේ නියමය මගින් ප්‍රකාශයට පත් කරමි. මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති රටවල් අතර අත්සන් කරන ලද මේ සම්මුතිය සාපරාධී කාරණාවල දී අන්‍යොන්‍ය නෛතික සහයෝගය ලබා දීම සඳහා ඇති කර ගන්නා ලදී. සම්මුතිය, වෙනත් කරුණු අතර ත්‍රස්තවාදය, ජාත්‍යන්තර සංවිධානාත්මක අපරාධ, මත්ද්‍රව්‍ය වෙළඳාම, මුදල් විශුද්ධිකරණය සහ සයිබර් අපරාධ සම්බන්ධයෙන් වන අපරාධ ඇතුළු අපරාධ වැළැක්වීම, විමර්ශනය කිරීම, නඩු පැවරීම සහ මැඩපැවැත්වීම සහ එකී අපරාධ සඳහා මුදල් සැපයීම සඳහා භාවිතා කිරීමට අදහස් කරන ලද අරමුදල් සහ යම් අපරාධ මගින් උපයාගත් දේ සහ අපරාධ මෙවලම් හඳුනා ගැනීම, රඳවා තැබීම, අහිමි කිරීම, ක්‍රියා විරහිත කිරීම හෝ රාජසන්තක කිරීම සඳහා පියවර ගැනීම සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමට අදාළ ඵලදායී සහයෝගීතාව වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් අදාළ වන අතර එය දෙදහස් විසිදෙකේ මාර්තු මස තිස් වැනි දින කොළඹ දී ඇති කරගන්නා ලදී.

ජනාධිපති නීතිඥ ආචාර්ය **විජයදාස රාජපක්ෂ**,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
2. භූතාන රාජධානිය
3. තායිලන්ත රාජධානිය
4. නේපාලය
5. මහජන බංගලාදේශ ජනරජය
6. ඉන්දියානු ජනරජය
7. මියන්මාර් සමූහාණ්ඩුව

EOG 10 - 0095

1A - G 37756 — 56 (2022/10)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*